**බුත්තල ප්‍රාදේශීය සභාව - 2023**
-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බුත්තල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් නොවන රු. 1,500,000 ක් වටිනා ගොඩනැගිලි 03 ක් සභාවේ ඉඩම් සහ ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු වත්කම් නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) කෝන්කැටිය ප්‍රජාශාලාව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම රු. 1,000,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |
| (ඇ) මහගොඩයාය කොම්පෝස්ට් ඒකකයට සවි කරන ලද සෝලා පද්ධතියේ වටිනාකම රු. 161,250 ක් සහ ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා, ඩීසල් ගැසීමට මිලදී ගත් ඉන්ධන පොම්පයේ වටිනාකම රු. 18,300 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) 2022 වර්ෂයේ වැඩ අවසන් කරන ලද රු. 3,518,109 ක කර්මාන්ත 03 ක සහ සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද රු. 38,717,046 ක කර්මාන්තයක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) පුස්තකාල සඳහා පරිත්‍යාග ලෙස ලද රු. 73,350 ක පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක ගිණුමට බැර කළ යුතු වුවත් ප්‍රාග්ධන යෙදුමට ආදායම් මගින් දායක ගිණුමට බැරකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඊ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුල ලද රු. 41,349,475 ක් සහ ඉන් දරන ලද ප්‍රාග්ධන වියදම් රු. 41,426,202 ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු ආදායම් වියදම් ගිණුම්ගත කළ යුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 208,498 ක් වැඩියෙන් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 619,167 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ලේඛනය අනුව ශේෂය රු. 4,231,942 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 4,130,263 ක් ලෙස රු. 101,679 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කළ යුතුය. |

### 1.6.2 <u>නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම හා උපලේඛනවල දක්වා ඇති වටිනාකම අතර රු. 1,863,177 ක වෙනසක් විය. | 2024 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොසැසඳීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6.3 <u>විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.</u>

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 900,305,632 ක් වූ වත්කම් විෂයයක් හා වගකීම් විෂයයක් සම්බන්ධයෙන් තක්සේරු වාර්තා, හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය සහ යාවත්කාලීන කරන ලද ණයහිමි ලේඛනය ඉදිරිපත් කර නොතිබුණු බැවින් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | විධිමත් තක්සේරුවක් ලබා ගැනීමට සහ භුක්ති විදින දේපල පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් ණයහිමි ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට විෂය නිලධාරීන් දැනුවත් කළ බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i)19 (xii) වගන්තිය | ප්‍රාදේශීය සභා සාප්පු සංකීර්ණයේ කඩකාමර 15 ක් බදු දීමේ දී විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව | දීර්ඝකාලීනව දේපළ බදුදීමට අදාලව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ii) 24(1)(අ) වගන්තිය | සභාව විසින් පාරවල් හා මංමාවත්වලට අදාල දැන්වීම් ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු වුවත් මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව සභාවට අයත් මංමාවත් 202 ක් ගැසට් පත්‍රයේ පල කර නොතිබුණි. | හඳුනාගත් මාර්ග ගැසට් පත්‍රයේ පල කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යවා ඇති බව. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීනකර ගැසට් පත්‍රයේ පල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | වර්ෂ 02 ක ඉක්ම වූ රු. 1,275,723 ක තැන්පත් ශේෂ 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 83(1) වන වගන්තිය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 74 ක් පරීක්ෂා කර අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි පිළිබඳව තාක්ෂණික නිලධාරීන් මගින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකරන බව. | සභා බලප්‍රදේශයේ ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් නියාමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන සහ යන්ත්‍ර 10 ක රාජ්‍ය ලාංඡනය හා සභාවේ නම පින්තාරු කර නොතිබුණි. | සභාව සතු සියලු වාහන හා යන්ත්‍රවල රාජ්‍ය ලාංඡනය හා නම පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය | සභාව විසින් නඩත්තු කරනු ලබන වීථි පහන් පිළිබඳව සංගණනයක් සිදුකර නොතිබුණු අතර වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | වීථි පහන් පිළිබඳව සංගණනයක් කිරීමට සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගතවීමට ඉදිරියේදී කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මිණි ට්‍රැක්ටරය වසර 7 ක සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර එය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත යොමුකර ඇති බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (උ) ඌව පළාත් පාලන කොමසාරිස්ගේ 2017 මාර්තු 10 දිනැති අංක 2017/01 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 02 ඡේදය | පළාත්පාලන සහකාර කොමසාරිස්ගේ පූර්ව අනුමැතියකින් තොරව සභාවට අයත් වාහන 07 ක් බලප්‍රදේශයෙන් පිටත රාජකාරී සඳහා යොදවා තිබුණි. | ඉදිරියේදී රාජකාරි සඳහා යෙදවීමට ප්‍රථම පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඌ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 17 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදුකරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,687,703 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,098,689 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභා ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. | ඇස්තමේන්තුගත ආදායම<br>රු. | බිල් කළ ආදායම<br>රු. | රැස්කළ ආදායම<br>රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය<br>රු. |
| (i) | වරිපනම් හා බදු | 6,248,067 | 3,394,049 | 4,140,316 | 4,253,733 | 2,191,067 | 2,183,916 | 2,247,344 | - |
| (ii) | කුලී | 66,344,000 | 9,662,650 | 7,259,825 | 2,402,825 | 6,604,400 | 9,734,116 | 6,242,250 | 3,491,866 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,381,000 | 1,571,796 | 1,703,796 | (132,000) | 2,000,000 | 1,956,545 | 1,956,545 | - |
| (iv) | වෙනත් ආදායම් | 68,319,000 | 43,078,107 | 34,590,953 | 8,487,154 | 14,374,000 | 24,637,080 | 14,733,051 | 9,903,129 |
| | එකතුව | 143,292,067 | 57,706,602 | 47,694,890 | 15,011,712 | 25,169,467 | 38,511,657 | 25,179,190 | 13,394,995 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 8,139,981 ක් වූ වරිපනම් බදු ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 3,917,397 ක් හෙවත් සියයට 48 ක් අයකරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | බිල් කළ ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 2,577,374 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 1,737,389 ක් හෙවත් සියයට 67 ක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක පැවතුණි. | 2024 වර්ෂයේදී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) 1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සභාව සතු දේපල 03 ක් බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 854,403 ක කුලී ආදායම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී ආදායම් ඉදිරියේදී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඈ) 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රය අනුව කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකළ යුතු බව දක්වා තිබුණද 2023 වර්ෂය සඳහා ආයතන 02 කින් පමණක් කසල සඳහා ගාස්තු අයකර තිබුණු නමුත් ගාස්තු අයකල යුතු අනෙකුත් ආයතන හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී ගාස්තු අයකළ යුතු අනෙකුත් ආයතන හඳුනා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අදාල අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතුයි. |
| <u>**කුලී**</u> | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 4,791,600 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 2,566,175 ක් හෙවත් සියයට 54 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී හිඟ කඩ කාමර කුලී අයකර ගන්නා බව. | බිල්කළ ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 1,243,217 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් වර්ෂය අවසන් වන විටත් රු. 1,030,876 ක් හෙවත් සියයට 83 ක් අයකරගෙන නොතිබුණි. ඒ අනුව හිඟ කඩ කාමර කුලී අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක පැවතිණි. | ඉදිරියේදී හිඟ කඩ කාමර කුලී අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

**<u>බලපත්‍ර ගාස්තු</u>**

| | | |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කර ඇති පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා වන මාර්ගෝපදේශයේ 2.5.2 වගන්තිය අනුව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව හා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව ලෙස අයකරනු ලබන මුදල් බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී ආයතන ප්‍රධානියාගේ උපදෙස් අනුව මෙම කටයුතු නිවැරදි කරන බව. | මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

**<u>වෙනත් ආදායම්</u>**

| | | |
|---|---|---|
| (අ) සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ආයතන 03 කට අයත් දූරකථන සම්ප්‍රේෂණ කුළුණු 03 කින් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු රු. 150,000 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) 2021 – 2023 කාල පරිච්ඡේදයට අදාලව ජල පාරිභෝගිකයින් 876 ක ගෙන් අයවිය යුතු රු. 1,507,336 ක හිඟ ජල ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2010 – 2023 කාල පරිච්ඡේදයට අදාලව සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලියටදීම වෙනුවෙන් අයවිය යුතු රු. 11,296,080 ක හිඟ යන්ත්‍ර කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල හිඟ මුදල් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 1,387,804 ක් සහ මුද්දර ගාස්තු රු. 7,715,758 ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**2.3** <u>අධිභාර</u>

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | -------------------- | ----------------- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවල දී පනවන ලද අධිභාර 06 කට අදාලව රු. 559,108 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් අධිභාර මුදල් අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ගැල්වනයිස් කොඩි කණු 68 ක් හා GI බට 18 ක් සභාව සතුව නොමැති බවට හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් කොඩි කණු හා GI බට නොමැති බව තහවුරු වුවහොත් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගන්නා බව. | වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල අලාභයන් අයකරගත යුතුය. |
| (ආ) බුත්තල පැරණි වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර අංක 02,11,12 හා 30 බදු දීමට අදාල බදු ගිවිසුම් ඇතුලත් ලිපිගොනු සහ කඩ කාමර අංක 11,12 සහ 30 ට අදාලව සභාව විසින් ගත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ඇතුලත් නඩු ලිපිගොනු සභාව සතුව නොතිබුණු අතර අදාල ලිපි ගොනු අස්ථානගතවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. මෙම කඩ කාමර වෙනුවෙන් 2008 වර්ෂයෙන් පසුව කඩ කාමර කුලී බිල්කර නොතිබුණි. | ලිපිගොනු අස්ථානගතවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානින් දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳ විමර්ශන කටයුතු සිදුකරන බව. | සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කරගත යුතු අතර අස්ථානගතවීම් සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) 2019 හා 2020 වර්ෂවලදී අනුමත නොකල ගොඩනැගිලි සැලසුම් 56 ක් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | තාක්ෂණික නිලධාරීන් මගින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ඉදිරි කටයුතු කරන බව. | බලප්‍රදේශයේ සිදුකරන ඉදිකිරීම් සම්බන්ධයෙන් නියාමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් 03 ක සහ ප්‍රජාශාලා 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සභාව සතු සියලු වත්කම්වල වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කඩ කාමර 52 කට අදාලව 2011 වර්ෂයේ තක්සේරු වාර්තා පදනම් කර ගනිමින් කුලී අයකර ගනිමින් පැවතුණි. | නව තක්සේරුවක් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | කඩ කාමර කුලී කාලීනව තක්සේරු කළ යුතුය. |
| (ආ) වරිපනම් බදු අයකිරීමට අදාලව 2004 වර්ෂයේදී අවසන්වරට දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන තිබුණු අතර කාලීනව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කාලීනව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන බව. | කාලීනව දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අය කළ යුතුය. |
| (ඇ) සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, 2018 ජූලි 24 දිනැති අංක එම්ඕ/ආර්ඩී/498 දරන ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2018 - 2023 කාල පරිච්ඡේදයට අදාලව රු. 27,482,200 ක ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. | මේ පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව. | නිවැරදි තක්සේරු කුලිය අයකළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාපතිවරයා භාවිතා කළ කැබ් රථය 2021 ජනවාරි සිට 2023 ජූලි මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාලව ධාවනය නොකළ කිලෝමීටර් 16,230 ක් සඳහා ඉන්ධන වියදම් ලෙස රු. 709,433.22 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කැබ් රථයේ ධාවන සටහන් වෙනස්වීමට අදාලව මූලික විමර්ශනයක් සිදුකරන මෙන් පළාත් පාලන කොමසාරිස්තුමා ගෙන් ඉල්ලීම් කර ඇති බව. | සභා අරමුදලින් වැඩිපුර දරන ලද ඉන්ධන වියදම වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකළ යුතුය. |
| (ආ) බුත්තල ප්‍රාදේශීය සභාවේ කාබනික පොහොර අලෙවි ඒකකයේ 2024 මාර්තු 05 දින සිදු කළ භෞතික තොග පරීක්ෂාව අනුව රු. 42,180 ක තොග ඌනතාවයක් පැවතුණි. | පොහොර මලු 37 ක් සඳහා තව දුරටත් මුදල් අයකළ යුතු බව. | තොග ඌනතාවයට අදාලව වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් වාහන 05 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | වාහනවල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව. | සභාව සතු වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |
| (ආ) මෝටර් වාහන පනතේ 2 වගන්තිය අනුව මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමකින් තොරව භාවිතයට ගත නොහැකි බව දක්වා තිබුණද යන්ත්‍ර 03 ක් සභාවට ලැබී වසර 11 ක් ගත වී තිබුණද ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචි සහතික ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ලියාපදිංචි සහතික ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ඉහත 3.4(ආ) ඡේදයේ සඳහන් මෝටර් වාහන පනතේ 25(1) වගන්තිය අනුව මෝටර් වාහනයක් ධාවනයට යොදා ගැනීමේදී වලංගු ආදායම් බලපත්‍රයක් ලබාගත යුතු වුවද ආදායම් බලපත්‍රයේ වලංගු කාලය අවසන්ව තිබුණු වාහන 04 ක් ධාවන කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. | නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන ලෙස විෂය නිලධාරීන් දැනුවත් කළ බව. | නියමිත දිනට වාහනවලට අදාල ආදායම් බලපත්‍ර ලබාගත යුතුය. |
| (ඇ) ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් වසර 01ත් වසර 17 ත් අතර කාලයක් අක්‍රියව පවතින අතර අදාල වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාහන හා යන්ත්‍රවල අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බව. | වාහන අදාල කාලයන්වලදී අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ----------------------- | -------------------- | ---------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව සේවකයින් 10 ක පුරප්පාඩු පැවති අතර තනතුරු 02 කට අදාලව අතිරික්ත සේවකයන් 11 ක් පැවතුණි. | සේවක බඳවා ගැනීම් කල් දැමීම මත ඌනතාවයන් පවතින බවත් 2023 වාර්ෂික ස්ථාන මාරු කිරීම් මත අතිරික්තයක් ඇති වී ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවාගත යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කරගත යුතුය. |
| (ආ) සේවකයින් 15 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 106,617 ක ණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | සේවක ණය ශේෂයන් කඩිනමින් අයකරගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අභ්‍යන්තර විගණනයක් සිදුකරන බව. | සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු අඛණ්ඩව සිදුකළ යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/01-2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | 2024 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරන බව. | මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ----------------------- | -------------------- | ----------------- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 195 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 08 සිට සියයට 72 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ----------------------- | -------------------- | ---------------- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාල දර්ශක හඳුනා ගැනීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගත යුතුය. |